කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சு
**MINISTRY OF LABOUR AND TRADE UNION RELATIONS**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT
# 2015




*"A satisfied Productive Labour Force"*

## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2015

**සම්පාදනය**
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

**ප්‍රකාශනය**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015**

**සම්පාදනය**
**සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය**

**ප්‍රකාශනය**
**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

තැ. පෙ. 1519, දෙවන මහල,
කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම
52/1, එක්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ.
දුරකථන - 011 2815813/ විද්‍යුත් තැපැල - sales@printec.lk
වෙබ් අඩවිය - www.printec.lk

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using wood free pulp which is made from 100% post consumer waste paper
*(Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)*

Recycling one ton of paper saves
17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

**We encourage you to recycle this Document after use.**

Printed by Printec Establishment (Pvt)Ltd - www.printec.lk



# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
# වාර්ෂික කාර්යසාධනය - 2015

## ඇතුල් පිටු

| | | පිටුව |
|---|---|---|
| 1. | අමාත්‍ය ගරු. ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය | iv |
| 2. | රාජ්‍ය අමාත්‍ය ගරු. රවීන්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය | vi |
| 3. | අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය | ix |
| 4. | අමාත්‍යාංශ කාර්ය සාධනය | 01 |
| i. | පාලන හා ආයතන අංශය | 05 |
| ii. | මුදල් අංශය | 06 |
| iii. | කම්කරු හා විදේශ සබඳතා අංශය | 07 |
| iv. | සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය | 08 |
| 5. | අමාත්‍යාංශය යටතේ වූ ආයතන | |
| i. | කම්කරු දෙපාර්තමේන්තුව | 09 |
| ii. | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 14 |
| iii. | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 18 |
| iv. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 19 |
| v. | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 20 |
| vi. | ශ්‍රම වාසනා අරමුදල | 21 |
| 6. | සංඛ්‍යාලේඛණ - කම්කරු දෙපාර්තමේන්තුව | 22 |
| 7. | ඡායාරූප - අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම් | 25 |

## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය
## ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයෙහි 2015 වර්ෂයෙහි ප්‍රගතිය විමසා බැලෙන කාර්යසාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටින් හා අභිමානයෙනි.

තිරසාර සංවර්ධනයක් රට තුළ ස්ථාපිත කිරීමට රටක ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ මට්ටමක තිබිය යුතුය. එම ඉලක්කයන් සපුරා ගැනීමට මිලියන 8.5 ක් පමණ වන සේවා නියුක්තියන්ගේ ඵලදායිතාවය ඉහළ නංවමින් තෘප්තිමත්, නිරෝගිමත් ශ්‍රම බලකායක් රට තුළ ස්ථාපිත කර ගැනීමේ ප්‍රධාන වගකීම කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය වෙත පැවරේ.

රටේ ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රට තුළ කාර්මික සාමය ඇති කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා අවශ්‍ය කම්කරු නීති, අණ පනත් බලාත්මක කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයකි. සේවක, සේව්‍ය හා රජය අතර ත්‍රෛපාර්ශවීයව ගොඩනැගෙන ශක්තිමත් සබඳතාවය ද ඒ සඳහා මනා පිටිවහලක් වේ. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සහ ගනු ලබන ප්‍රතිපත්තිමය තීන්දු එම සබඳතාවයන් තවදුරටත් වර්ධනය කිරීමට ඉවහල් වේ.

පසුගිය කාල පරිච්ඡේදයේ සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ඉහළ නැංවීමටත්, වෘත්තීය සුරක්ෂිතතාවය තව දුරටත් ශක්තිමත් කිරීමටත් අවැසි ක්‍රියා මාර්ග රැසක් අමාත්‍යාංශය විසින් ගනු ලැබීය. එසේම ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු ජාත්‍යන්තර ආයතන සමග ශක්තිමත් සබඳතා වර්ධනය කර ගැනීමට අප සමත් විය. එසේම වැඩ කරන ජනතාව සමග හා වෘත්තීය සමිති සමග නිරන්තරයෙන් සාකච්ඡා පවත්වමින් ඔවුන්ගේ ගැටළුවලට සාධාරණ විසඳුම් ලබා දීමටත් අපට හැකි විය. ළමා ශ්‍රමයෙන් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමට අවශ්‍ය මුලික අඩිතාලම දැමීම, වැඩ කරන කාන්තා අයිතීන් සුරැකීමට පියවර ගැනීම, කම්කරු අණපනත් කාලානුරූපීව වෙනස් කිරීම, සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය ඉහළ නැංවීමට වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීම ඇතුළු වීශාල කාර්යභාරයක් අමාත්‍යාංශයක් ලෙස 2015 වසරේ ක්‍රියාත්මත කිරිමට හැකි වීම අප ලැබූ සුවිසල් ජයග්‍රහණයකි.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වය හා මග පෙන්වීම යටතේ පසුගිය කාලය තුළ වැඩ කරන ජනතාව වෙනුවෙන් වඩාත් සඵලදායි ඉලක්කගත වැඩපිළිවෙලක් අප විසින් ක්‍රියාත්මක කර ඇත. එම කාර්යය වඩාත් කාර්යක්ෂමවත්, සාර්ථකවත් සිදුකිරීමට අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය විශිෂ්ටය. එසේම එයට නොදෙවෙනි සහයක් ලබා දුන් අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පුදකරමි. එසේම මා සමග අමාත්‍යාංශයට අදාල ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීමේදී සහයෝගය දැක්වූ රාජ්‍ය අමාත්‍යතුමාට ද මාගේ කෘතවේදී ස්තූතිය පිරිනමමි.

**ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය



## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය
## ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, සේවක අර්ථ සාධක අරමුදල සහ අනෙකුත් ආයතන විසින් ශ්‍රී ලංකාවේ කම්කරු ජනතාව වෙනුවෙන් ඉටුකරන ලද කාර්යභාරය, එහි ප්‍රගතිය පිළිබඳව එළිදක්වනු ලබන 2015 කාර්යසාධන වාර්තාවට විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා ලෙස පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

ගෙවී ගිය වසරෙහි රට තුළ වඩාත් යහපත් වැඩ පරිසරයක් බිහි කිරිම තුළින් අපගේ ඉලක්ක කරා යාමට අපි කටයුතු කලෙමු. කාර්මික සාමය හා සංහිදියාව පවත්වා ගනිමින් වැඩ කරන ජනතාවගේ ශ්‍රම ඵලදායිතාව හා ශ්‍රමතාවය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයකි.

ශ්‍රී ලංකාවේ මිලියන 8.5 කට ආසන්න සේවක ජනතාවගේ සේවා තත්ත්වයන් උසස් කොට ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩාත් යහපත් කරවීම පිණිස අමාත්‍යාංශය විසින් මෙම වර්ෂයේදී පියවර ගෙන ඇති බව දන්වා සිටිනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා හා ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගේ මග පෙන්වීම යටතේ අමාත්‍යාංශ ලේකම්තුමා හා සියලු ආයතන ප්‍රධානීන් ඇතුළු නිළධාරින් විසින් ඉටු කරනු ලැබූ සේවාවන්ට මාගේ කෘතඥතාවය පිරිනමන අතර, තව දුරටත් වැඩ කරන ජනතාවගේ යහපත උදෙසා විශාල මෙහෙයක් කිරීම තුලින් යන ගමනට දායක වන ලෙස සේවක සේව්‍ය දෙපාර්ශවයට ආරාධනා කරමි.

**රවින්ද්‍ර සමරවීර**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය



''වැඩකරන ශ්‍රී ලාංකික ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් අභිමානයෙන් යුතුව එකම වහලක් යටින් ලබා දීම සඳහා ඉදිකරනු ලබන "මෙහෙවර පියස"දෙතිස් මහල් ගොඩනැගිල්ල කඩිනමින් ඉදිවෙමින් පවතී. තෘප්තිමත් මෙන්ම ඵලදායී සේවක ප්‍රජාවක් දැයට දායාද කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තීන් මෙන්ම කම්කරු අණපනත් 61 ක් ක්‍රියාත්මක කිරීමට මෙම අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව ඇතුලු සියළුම ආයතන සුවිශේෂ දායකත්වයක් දක්වනු ලබයි.''






## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතන 2015 වර්ෂයේ දී ලැබූ ප්‍රගතිය විස්තර කෙරෙන්නා වූ මෙම ප්‍රකාශනය ඔබ අතට පත්කරන්නේ ඉමහත් සතුටිනි.

වැඩ බිමේ සාමය හා සංහිඳියාව දිගුකාලීන වූත් තිරසාරවූත් සංවර්ධනයේ නොබිඳෙන අත්තිවාරමයි. එහිදී සේවක, සේව්‍ය හා රජය අතර වූ මනා ත්‍රෛපර්ශවීය සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති වගකීම අතිමහත්ය. ඒ අනුව සමාලෝචිත කාලය තුළ කම්කරු අයිතීන් වෙනුවෙන් පෙළ ගැසෙන ලෝකයේ ශ්‍රී ලාංකීය කම්කරුවාගේ අයිතීන් සුරක්ෂිත කරනු වස් සුවිශාල කාර්යභාරයක් 2015 වර්ෂයේ දී සිදුකළ බව මහත් අභිමානයෙන් යුතුව සඳහන් කරන්නෙමි.

ගත වූ කාලය තුළ සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයන් හට තම ශේෂයෙන් 30% ක් නිවාස හෝ සෞඛ්‍යමය අරමුණක් සඳහා ආපසු ගෙවීමේ කටයුතු 2015 මැයි මස 27 වන දින ආරම්භ කරන ලදී. මෙම කටයුත්තෙහි පළමු අදියර වශයෙන් සේවක අර්ථසාධක අරමුදල් අංශය යටතේ අනු අංශයක් ලෙස ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල තුළ 30% ප්‍රතිලාභ ගෙවීම් අංශය ස්ථාපනය කළ අතර, අදාළ කටයුතු මැනවින් සිදුකෙරෙමින් පවතී.

එමෙන්ම කාර්මික සාමයෙන් පිරුණු වැඩ පරිසරයක් ගොඩනංවනු වස් ආයතනවල සේව්‍ය සේවක ප්‍රජාව අතර සමාජ කතිකාවත ප්‍රවර්ධනය කිරීම තුළින් කාර්මික ආරවුල් අවම කිරීමටත්, මෙයට තවදුරටත් නෛතික පසුබිමක් ලබාදීම උදෙසා සාමූහිත ගිවිසුම් ඇති කිරීමත් සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කරමින් පසුගිය වසරට සාපේක්ෂව 20% කින් පමණ සාමූහික ගිවිසුම් ලියාපදිංචි කරවීමට හැකි විය. ශ්‍රමයට නිසි ගෞරවය හා ඇගයීම ලබාදෙමින්, කම්කරු අයිතීන් තහවුරු කරමින් ඔවුන්ගේ ජීවන අපේක්ෂාවන් ඉටුකර ගැනීමට සහාය දීමක් වශයෙන් දේශපාලන හේතූන් මත රැකියා අහිමි වූ තුල්හිරිය හා පූගොඩ පේෂකර්මාන්ත ශාලා සේවකයින් 2396 දෙනෙකුට රු. 25,000/- බැගින් වූ අවසන් කරුණාසහගත දීමනාවක් පිරිනැමීමේ කටයුතු සිදුකරමින් පවතී.

තවද 1980 ජූලි වැඩවර්ජනයෙන් රැකියා අහිමි වූ, වයස අවුරුදු 65 ඉක්ම වූ සේවකයින් වෙත මාසිකව රු. 6000/- ක දීමනාවක් ගෙවීමට මුදල් අමාත්‍යාංශය සමග එක්ව කටයුතු කොට ඇත. කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. ගෙවීම් කටයුතු මේ වන විට ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන සියලුම දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට විමධ්‍යගත කර ඇත.

වැඩකරන ශ්‍රී ලාංකික ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් අභිමානයෙන් යුතුව එකම වහලක් යටින් ලබා දීම සඳහා ඉදිකරනු ලබන "මෙහෙවර පියස" දෙතිස් මහල් ගොඩනැගිල්ල කඩිනමින් ඉදිවෙමින් පවතී. තෘප්තිමත් මෙන්ම ඵලදායී සේවක ප්‍රජාවක් දැයට දායාද කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තීන් මෙන්ම කම්කරු අණපනත් 61 ක් ක්‍රියාත්මක කිරීමට මෙම අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව ඇතුලු සියළුම ආයතන සුවිශේෂ දායකත්වයක් දක්වනු ලබයි.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය මගපෙන්වීම හා අනුශාසකත්වය ලබාදුන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු ජෝන් සෙනෙවිරත්න මැතිදුන්ට හා රාජ්‍ය අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිදුන් වෙත කෘතඥතාව පල කරමි.

එසේම ඉහත කාර්ය සාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතුලු කාර්ය මණ්ඩලයටත්, කම්කරු කොමසාරිස් ජනරාල්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, කම්කරු වන්දි කොමසාරිස්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරී සහ එම ආයතනවල සියලුම මට්ටම්වල නිලධාරීන්ටත්, මෙම ප්‍රකාශනය පිළියෙල කළ අමාත්‍යාංශයේ සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ සියලුම නිලධාරීන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**එස්.එම්. ගෝඨාභය ජයරත්න**
ලේකම්
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වූවන්ගේ ජීවන හා සේවා තත්ත්වයන් වර්ධනය කිරීම මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය-සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූලික පරමාර්ථ වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින්වර ඇති කරන ලද කම්කරු නීති හා අණපනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්ය භාරයද පුළුල්ය. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර පහත පරිදි වේ.

## දැක්ම

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

## මෙහෙවර

කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතභාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

## අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශ





2015/12/31 දිනට සංවිධාන ව්‍යුහය





## අමාත්‍යාංශයේ අරමුණු

- ත්‍රෛපාර්ශවය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය සේවක සබඳතා ශක්තිමත් කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම.
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම.
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, ආරක්ෂා කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානතාව දිරි ගැන්වීම.
- කම්කරු නීති රීති හා පරිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම.
- සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම.

## අමාත්‍යාංශය වෙත පැවරි ඇති රාජකාරි

2015.09.21 දින ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට පවරන ලද බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් පහත දැක්වේ.

1. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගිතාව පවත්වා ගැනීම.

4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම.

5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම.

6. කම්කරු සබඳතා වලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු.

7. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.

9. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

10. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම.

11. විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කටයුතු.

12. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

13. කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල සහ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.

14. ඉහත 13 හි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

## ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන අණ පනත්

1. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත.
2. 1935 අංක 14 දරන වෘත්තිය සමිති ආඥා පනත.
3. 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත.
4. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත.
5. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත.
6. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත.
7. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත.
8. 1956 අංක 47 දරන ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත.
9. 1956 අංක 37 දරණ ගාස්තු අයකිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත.
10. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත.
11. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ ( විශේෂ විධිවිධාන ) පනත.
12. 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත.
13. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත.
14. 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත.
15. 2009 අංක 38 දරන වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත.
16. 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත.

## ශ්‍රී ලංකාවේ යහපත් රැකියා සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් අභිබවා යා යුතු "යහපත් රැකියා" වලට අදාල ගැටළු පරාසයක් මේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් සලකා බලයි. මෙමගින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම මෙම ප්‍රතිපත්තියෙන් රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මාණය කෙරෙන රැකියා පිළිගත හැකි තත්ත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි.

සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් 4ක් තුළ ක්‍රියාත්මක වේ.

- රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායිතාව.
- වැඩබිමෙහි හිමිකම.
- සමාජ ආරක්ෂණය.
- සමාජ කතිකාවත.

මෙම ප්‍රධාන ස්ථම්භ 4 ට අමතරව පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් ද ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

1 ඵලදායිතා ප්‍රවර්ධනය.
2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම.

ඒ අනුව යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා අමාත්‍යාංශය යටතේ පවතින සියළුම ආයතන විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් (Thrust Areas ) ඔස්සේ කටයුතු කරනු ලබයි.

1 කාර්මික සාමය හා සංහිදියාව.
2 කම්කරු ප්‍රමිතීන් සහ නීති රීති ක්‍රියාත්මක කිරීම.
3 කාන්තා ශ්‍රමිකයින් සුරැකීම හා ළමා ශ්‍රමය පිටු දැකීම.
4 වෘත්තිය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය.
5 සමාජ ආරක්ෂණය.
6 කම්කරු ක්ෂේත්‍රයට අදාල අධ්‍යාපන, පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය.





## පාලන හා ආයතන අංශය

පරිපාලන අංශය, ආයතන අංශය හා මාධ්‍ය ඒකකය පාලන හා ආයතන අංශයේ විෂය පථයට ඇතුලත් වේ. පාලන අංශයට සාමාන්‍ය පරිපාලනය, ප්‍රසම්පාදන කටයුතු, කළමනාකරණය, නඩත්තු කටයුතු, පුහුණු කිරීම් හා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම යනාදී වගකීම් සම්භාරයක් පැවරී ඇත. ආයතන අංශය මගින් අමාත්‍යාංශයේ, අමාත්‍ය කාර්යාලයේ හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කටයුතු සිදු කරනු ලබයි. එසේම කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි මානව සම්පත් කළමනාකරණයට අදාල කටයුතු හා පරිපාලනය මෙම අංශය හරහා ඉටු කරනු ලැබේ. එසේම පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව, උපදේශක කාරක සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව යනාදී කාර්යාල මගින් හා මහජනතාව විසින් එවනු ලබන විවිධාකාර ඉල්ලීම් හා පෙත්සම් සම්බන්ධයෙන් ද ආයතන අංශය කටයුතු කරනු ලබයි.

### මානව සම්පත් සංවර්ධනය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි නිලධාරින් හට දෙමළ භාෂා දැනුම වර්ධනය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව පාඨමාලා සංවිධානය කරන ලදී. පාලන අංශය මඟින් අමාත්‍යාංශයේ නිලධාරින්ට තම සේවා අවශ්‍යතාවය මත පශ්චාත් උපාධි පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා හැදැරීමට මූල්‍ය පහසුකම් සැලසීම ඇතුලු අවශ්‍ය අනෙකුත් පහසුකම් සලසා දෙන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ජාතික ශ්‍රම අධයන ආයතනය, වරලත් ගණකාධිකාරි ආයතනය, ශ්‍රී ලංකා පදනම හා නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලබන පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් සහභාගී කරවන ලදී.

උපාධිධාරි අභ්‍යාසලාභීන් රජයේ ආයතනවල සංවර්ධන ව්‍යාපෘති සඳහා බඳවා ගැනීම යටතේ අමාත්‍යාංශයට බඳවා ගනු ලැබූ උපාධිධාරි අභ්‍යාසලාභීන් වෙත පුහුණුව ලබා දී ඇති අතර, ඔවුන් අමාත්‍යාංශයේ විවිධ අංශවල රාජකාරි කටයුතු සඳහා යොමු කර ඇත.

### වෙනත් විශේෂ කටයුතු

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු අනුමත කරවාගෙන ඇති අතර එම තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කරමින් කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා කටයුතු කරමින් පවතී.

2015.05.15 දිනැති අංක 4/2014 අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් තුල්හිරිය පුගොඩ පේෂකර්මාන්ත ශාලාවල සේවය කරන ලද දේශපාලන හේතූන් මත රැකියා අහිමි වූ 2396 දෙනෙකුට කරුණාසහගත මුදලක් ලබා දීමට කරන ලද යෝජනාවට අනුව, වන්දිලාභීන් 1200ක් සඳහා මිලියන 30ක මුදලක් පිරිනැමීමට කටයුතු කර ඇත.

2014 අයවැය මඟින් කරන ලද යෝජනාවක් අනුව 1980 ජුලි වර්ජනයට ලක් ව රැකියා අහිමි වූ පෞද්ගලික හා රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට අදාලව කටයුතු සම්බන්ධීකරණය කරමින් මුදල් අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබා දීමට කටයුතු කරමින් රැකියා අහිමිවූවන් වෙත සහන සැලසීමට කටයුතු කරමින් සිටි.

## 2015.12.31 දිනට සේවක මණ්ඩල තොරතුරු

| | ආයතනය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අමාත්‍යාංශය | 121 | 101 | 20 |
| 2 | කම්කරු දෙපාර්තමේන්තුව | 3,127 | 2,493 | 634 |
| 3 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 703 | 608 | 95 |
| 4 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 45 | 11 | 34 |
| 5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 25 | 13 | 12 |
| 6 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 40 | 25 | 15 |
| 7 | ශ්‍රම වාසනා අරමුදල | 14 | 12 | 2 |
| | **මුළු සේවක සංඛ්‍යාව** | **4,075** | **3,263** | **1,052** |

## මුදල් අංශය

2015 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය කටයුතු

| වැඩසටහන | ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ප්‍රතිපාදනය (රු) | වියදම (රු) | ඉතිරිය (රු) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | 1 | පුනරාවර්තන | 20,210,000 | 15,762,146 | 4,447,854 | 77.9 |
| | | මූලධන | 2,790,000 | 832,772 | 1,957,228 | 29.84 |
| | | **එකතුව** | **23,000,000** | **16,594,918** | **6,405,082** | **72.15** |
| 1 | 2 | පුනරාවර්තන | 100,400,000 | 98,811,845 | 1,588,155 | 98.41 |
| | | මූලධන | 30,550,000 | 24,884,666 | 5,665,334 | 81.45 |
| | | **එකතුව** | **130,950,000** | **23,696,511** | **7,253,489** | **94.46** |
| 1 | 11 | පුනරාවර්තන | 7,150,000 | 5,698,970 | 1,451,030 | 79.70 |
| | | මූලධන | 2,800,000 | 1,370,253 | 1,429,747 | 48.93 |
| | | **එකතුව** | **9,950,000** | **7,069,223** | **2,880,777** | **71.04** |
| 2 | 3(2) | පුනරාවර්තන | 14,000,000 | 13,990,397 | 9,603 | 99.93 |
| | | මූලධන | 2,500,000 | 1,696,391 | 803,609 | 67.85 |
| | | **එකතුව** | **16,500,000** | **15,686,788** | **813,212** | **95.07** |
| 2 | 3(3) | පුනරාවර්තන | 6,000,000 | 5,704,435 | 295,565 | 95.07 |
| | | මූලධන | 4,500,000 | 4,483,538 | 16,462 | 99.63 |
| | | **එකතුව** | **10,500,000** | **10,187,973** | **312,027** | **97.02** |
| 2 | 4 | පුනරාවර්තන | 45,150,000 | 43,350,456 | 1,799,544 | 96.01 |
| | | මූලධන | 1,100,000 | 638,486 | 461,514 | 58.04 |
| | | **එකතුව** | **46,250,000** | **43,988,942** | **2,261,058** | **95.11** |
| 2 | 5 | පුනරාවර්තන | 22,650,000 | 19,313,326 | 3,336,674 | 85.26 |
| | | මූලධන | 959,000 | 531,609 | 418,391 | 55.95 |
| | | **එකතුව** | **23,600,000** | **19,844 ,935** | **3,755,065** | **84.08** |
| | **මුළු එකතුව** | පුනරාවර්තන | 215,560,000 | 202,631 ,575 | 12,928,425 | 94.0 |
| | | මූලධන | 45,190,000 | 34, 437 ,715 | 10,752,285 | 76.2 |
| | | **එකතුව** | **260,750, 000** | **237,069 ,290** | **23,680,710** | **90.91** |

අංශය විසින් විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම, අග්‍රිම ගිණුම, පොදු තැන්පත් ගිණුම යන වාර්ෂික ගිණුම් නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.





## කම්කරු සහ විදේශ සබඳතා අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කර ගත් බැඳීම අන්තර් ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාලව කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය වෙනුවෙන් කටයුතු කිරීම කම්කරු හා විදේශ සබඳතා අංශය මගින් ඉටු කරනු ලබයි.

**2015 වසරේ කාර්ය සාධනය**

1. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථාවේ අංක 19 හා අංක 22 යටතේ වාර්ෂිකව ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත යැවිය යුතු වාර්තා සම්පාදනය කිරීම.

2. කම්කරු ක්ෂේත්‍රයේ සහයෝගීතාව ගොඩනැංවීම උදෙසා සිදු කරන ලද විදේශීය සංචාර සම්බන්ධව කටයුතු කිරීම.

3. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාල වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම.

   i) අනර්ථකාරී ළමා ශ්‍රමය පිටු දැකීම සම්බන්ධයෙන් වන ඇමරිකා එක්සත් ජනපද කම්කරු දෙපාර්තමේන්තුව වෙත වාර්ෂිකව යැවිය යුතු වාර්තාව සම්පාදනය කිරීම.
   ii) EU GSP+ සහනය ලබා ගැනීම සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමේ වාර්තාව සම්පාදනය කිරීම සහ ඒ සම්බන්ධව තව දුරටත් කටයුතු කිරීම.
   iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට අදාල තොරතුරු සැපයීම.

4. ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රය හා සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගය ඇතිව අධ්‍යයන කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම

   i) මාතෘත්ව ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ඇති කිරීම
   ii) වෘත්තිය අනතුරු ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීම
   iii) අවිධිමත් ආර්ථිකයන් සම්බන්ධව සමාජ ආරක්ෂණ තලයක් ඇති කිරීම

5. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්තව සෑම මසකම රැස්වන ජාතික කම්කරු උපදේශක සභා රැස්වීමේදී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම.

6. කම්කරු අමාත්‍යාංශයේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් විදේශ පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීමට අදාල සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම.

7. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2016 සමුළුවාරය සඳහා සාකච්ඡාවට ගැනෙන ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු යැවීම. (Employment & decent work for peace & resilience revision of the employment (Transition from war to peace recommendation, 1944 (No. 71) )

8. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය සහයෝගීතාව ඇතුව ක්‍රියාත්මක කරන Child Activity Survey සම්බන්ධයෙන් සියලුම ආකාරයේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
   (මෙහිදී ඉදිරි ක්‍රියාකාරී වැඩ පිළිවෙල සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු මෙම අංශය විසින් සිදු කරයි.)

9. ජාතික කම්කරු උපදේශක සභාව රැස්වීම සහ පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් වන සාකච්ඡා ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් සිදුකිරීම.

## සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම් කිරීම මෙම අංශයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අමතරව පහත සදහන් කාර්යයන්ද මෙම කාල පරිච්ඡේදය තුළ අංශය විසින් ඉටුකර ඇත.

- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාල පාර්ශව වෙත යොමු කිරීම.

- මුදල් අමාත්‍යාංශය හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකා සේවක සඟරාව හා මැයි දින පුවත්පත් අතිරේකය ඇතුලුව අමාත්‍යාංශයේ වෙනත් ප්‍රකාශන සම්බන්ධ සියලු කටයුතු සිදුකිරීම.
  - සමාලෝචන කාලයට අදාළව ශ්‍රී ලංකා සේවක සඟරාවේ කාණ්ඩ අංක 65 - කලාප 3, 4 සහ කාණ්ඩ අංක 66 - කලාප 1, 2, 3 නිකුත් කරන ලදී.

- යහපත් රැකියා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
  - සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ රුපියල් මිලියන 14.5 ක් විවධ ආයතන හා අංශයන් වලට වෙන් කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන දිනට එහි ප්‍රගතිය පහත දක්වේ.

| ව්‍යාපෘති ක්‍රියාත්මක වන ආයතන | වෙන් කළ මුදල (රු.මිලියන) | 2015.12.31 දිනට ප්‍රගතිය (රු.මිලියන) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. කම්කරු දෙපාර්තමේන්තුව | 9.5 | 8.8 | 92.6% |
| 2. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 0.5 | 0.5 | 100% |
| 3. කම්කරු අමාත්‍යාංශය | 4.5 | 4.5 | 100% |
| **එකතුව** | **14.5** | **13.8** | **95%** |

- අමාත්‍යාංශ තොරතුරු තාක්ෂණ පද්ධති මෙහෙයවීම, රාජ්‍ය ජාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ තොරතුරු යාවත්කාලීන කිරීම.

- අමාත්‍යංශයේ නිල වෙබ් අඩවිය වන www.labourmin.gov.lk යාවත්කාලීන කර පවත්වා ගෙන යෑම.

- පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා අවස්ථාව සඳහා කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

  සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂ වැඩසටහනක් වන මේ යටතේ වැඩසටහන් 6 ක් වතු හා ආයෝජන ප්‍රවර්ධන කළාපවල ආයතන ආවරණය වන පරිදි පවත්වන ලදී. එමෙන්ම ත්‍රෛයිපාර්ෂවීය නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් කම්කරු මහලේකම් කාර්යාල පරිශ්‍රයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබද සම්මන්ත්‍රණයක්ද පැවැත්වීමට කටයුතු කර ඇත.





# කම්කරු දෙපාර්තමේන්තුව

1923 අංක 01 දරන ඉන්දියානු ආගමික කම්කරු ආඥා පනතට අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ ආරම්භය සිදු වී ඇත. ගත වු වසර 92ක කාලසීමාව තුළ ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකය විසින් ක්ෂේත්‍රයට අදාළව අණපනත් 50කට අධික ප්‍රමාණයක් සම්මත කර ඇත. දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යභාරය මෙම අණපනත් ක්‍රියාවේ යෙදවීම වේ. මෙම කාර්යය සඳහා ප්‍රධාන කාර්යාලය තුළ අංශ 14 ක්, කලාප කම්කරු කාර්යාල 11 ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක්, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් ක්‍රියාත්මක වන අතර 2015 වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ මුළු සේවක සංඛ්‍යාව 2,405 කි.

## කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

- රටේ කාර්මික සාමය පවත්වා ගෙන යාම උදෙසා කාර්මික ආරවුල් සමථ කිරීම හා කම්කරු නීති ක්‍රියාත්මක කිරීම තුළින් කාර්මික ආරවුල් විසදීම.

- රටේ කාර්මික සාමය තහවුරු කිරීම උදෙසා සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම හා කම්කරු නීති සම්බන්ධයෙන් සේවක ප්‍රජාව දැනුවත් කිරීම.

- කර්මාන්ත ක්ෂෙත්‍රයන්ට අදාළ ශ්‍රම ප්‍රමිතීන් ක්‍රියාවේ යෙදවීම, නව කර්මාන්ත ක්ෂේත්‍රයන් පිළිබඳව සමීක්ෂණ සිදුකිරීම හා ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව ප්‍රමිතින් සකස් කිරීම.

- සේවක අර්ථසාධක අරමුදල් ප්‍රවර්ධනය කිරීම, එහි ප්‍රතිලාභ සාමාජිකයින් වෙත ලබාදීම හා අනුමත පුද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය.

- ළමුන්, කාන්තාවන් හා තරුණයන් රැකියාවන් හි නිරත කරවීමේදී ඔවුන්ගේ රැකවරණයට අදාළ නීති ක්‍රියාත්මක කිරීම.

- කර්මාන්ත ක්ෂේත්‍රයන් හි සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ආරක්ෂාවට අදාළව ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදයන් හඳුන්වා දීම, ඒ පිළිබඳ දැනුවත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය.

## කම්කරු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය








### කාර්මික සාමය

රටක කාර්මික සාමය පැවතීමේ ප්‍රධාන සංරචකයක් වන්නේ වාර්තා වන කාර්මික ආරවුල් සංඛ්‍යාව වේ. දෙපාර්තමේන්තුව මගින් ආයතනික මට්ටමෙන් මෙන්ම ජාතික මට්ටමින් සිදු කරන දැනුවත් කිරීම් හා නිරන්තර කාර්මික පරීක්ෂණ මගින් වාර්තා වන කාර්මික ආරවුල් ප්‍රමාණය පසුගිය කාලසීමාව පුරාවටම ක්‍රමික අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි වේ.

**වාර්තා වූ කාර්මික ආරවුල් ප්‍රමාණය : 2011 - 2015**

| වර්ෂය | කාර්මික ආරවුල් ප්‍රමාණය |
|---|---|
| 2011 | 3,756 |
| 2012 | 3,702 |
| 2013 | 3,204 |
| 2014 | 2,948 |
| 2015 | 1,561 |




### සමාජ කතිකාවත

සේව්‍ය සේවක දෙපාර්ශවය අතර සන්නිවේදනය, අදහස් විමසීම හා ඒක්ව තීරණ ගැනීම ප්‍රචලිත කිරීම සඳහා ඔවුන් අතර කතිකාව සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් කාර්මික සාමය හා සංහිඳියාව පවත්වා ගත හැකිය. මේ සම්බන්ධව කටයුතු කිරීමට කම්කරු දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක් පවතින අතර එම ඒකකය මගින් සමාජ කතිකාවත පිළිබඳ නිරන්තර දැනුවත් කිරීම සිදු කරනු ලබයි. තවද, සමාජ කතිකා ක්‍රමවේදයන් මනාව පවත්වාගෙන යන ආයතන පිළිබඳව ඇගයීමට තරගාවලියක් හා සම්මාන ප්‍රදානෝත්සවයක් පවත්වන අතර 2015 දෙසැම්බර් මස 20 දින මෙම සම්මාන ප්‍රදානෝත්සවය සිදු කරන ලදී.

### වැටුප් හා සේවා කොන්දේසි

පෞද්ගලික අංශයේ සේවා නියුක්ත වූවන්ගේ රැකියා සුරක්ෂිතතාවය හා සුබසාධනය කෙරෙහි බලපාන්නා වූ සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්ත්වයන් ලබා දීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පහත පනත් යටතේ කටයුතු කිරීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

1. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
2. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
3. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත

නිල කාලය අවසන් වන පඩි පාලක සභා සඳහා නියෝජිතයන් පත්කිරීම, පඩි පාලක සභා අවම වැටුප යාවත්කාලීන කිරීම (වර්තමානය වන විට විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් පඩි පාලක සභා 44ක් ක්‍රියාත්මක වෙමින් පවතී) ඇතුළුව පඩි පාලක සභා ආශ්‍රිතව පසුගිය වසර තුළ ක්‍රියාත්මක කළ වැඩ සටහන් පහත දක්වා ඇත.

1. නැව් තටාක තොටුපලවල් හා වරායන්හි ප්‍රවාහන කර්මාන්තයය පිළිබඳ පඩි පාලක සභාව ප්‍රති ව්‍යුහගතකරණයට අදාළ කටයුතු සිදු කිරීම.

2. තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව ප්‍රතිව්‍යුහගතකරණයට අදාල කටයුතු සිදු කිරීම.
3. අයිස් සිසිල් බීම හා පළතුරු යුෂ හා ජෑම් සැදීමේ කර්මාන්තය පිළිබඳව පඩි පාලක සභාවේ ආවරණය පුළුල් කිරීම.
4. රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සංශෝධිත සේවා පාර්ශව නැවත සාකච්ඡා කිරීමට කටයුතු කිරීම
5. කම්කරු නිතී පිළිබඳ සේව්‍ය හා සේවක පාර්ශව දැනුවත් කිරීම

## සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් රැස් කිරීම

පනතින් ආවරණය කරනු ලබන සියලුම සේවකයින් වෙනුවෙන් යම් මාසයක දායක මුදල් අදාල සේවා යෝජකයින් විසින් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කළ යුතුය. පසුගිය වසර 05ක කාල සීමාව තුළ දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතිය පහත ප්‍රස්තාර සටහනින් දැක්වේ.

**දායක මුදල් රැස් කිරීම : 2011 - 2015**

| වර්ෂය | දායක මුදල (රු.මිලියන) |
|---|---|
| 2011 | 61,879 |
| 2012 | 70,157 |
| 2013 | 77,335 |
| 2014 | 90,049 |
| 2015 | 102,064 |




## සේවක අර්ථසාධක අරමුදල් පූර්ව ප්‍රතිලාභ ගෙවීම

කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන 2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් සංශෝධනය කරන ලද 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට අදාළව සේවක අර්ථසාධක අරමුදලෙන් 30% ප්‍රතිලාභ ගෙවීමේ රෙගුලාසි 2013 මැයි 13 දිනැති අංක 1810/20 ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015/03/02 දින පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදි. ඒ අනුව, ඉඩම් මිලදී ගැනිම, නිවාස ඉදිකර ගැනීම හා වෛද්‍ය හේතූන් සඳහා සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයගේ පවතින ශේෂයෙන් 30% ක ප්‍රමාණයක් ආපසු ගෙවීමේ කටයුතු 2015 මැයි මාසයේ ආරම්භ කරන ලදුව දැනට ක්‍රියාත්මක වේ.

## වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය

සේවා ස්ථානවල සිදු වන අනතුරු හා ආපදා, වෘත්තීයමය රෝගාබාධ හා රැකියා කටයුතු ආශ්‍රිතව ඇතිවන අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් අවම කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. අනතුරු හා උපද්‍රව වලින් තොර මෙන්ම, වෘත්තීය සෞඛ්‍ය මනාව සුරැකෙන සේවා පරිසරයක් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ යාමට මෙන්ම, නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමටද හේතු වන බව නොරහසකි. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය නෛතික අවශ්‍යතාවයක් වේ.





## 2015 වර්ෂය තුළ කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ ක්‍රියාකරකම්වල ප්‍රගතිය

| | |
|---|---|
| කර්මාන්තශාලා අනතුරු පරීක්ෂණ පැමිණිලි විමර්ෂණය | 5,090 |
| සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් | 205 |
| අධි-අන්තරායකාරී යන්ත්‍ර සූත්‍ර පරීක්ෂණය | 7,433 |
| කර්මාන්තශාලා නව ලියාපදිංචි කිරීම් | 1,306 |
| නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 20 |

## 2015 වර්ෂය තුළ වෘත්තීය ස්වස්ථතා අංශයේ ක්‍රියාකරකම්වල ප්‍රගතිය

| | |
|---|---|
| පාරිසරික මිනුම් | 153 |
| ජීව විද්‍යාත්මක පරීක්ෂණ | 330 |
| වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතා විගණනයන් | 159 |
| දැනුවත් කිරීම් වැඩසටහන් | 204 |
| සේ.අ.අ (EPF)හා සේ.නි.භා.අ (ETF) වෛද්‍ය මණ්ඩල | 24 |

## අනර්ථකාරී ළමා ශ්‍රමය පිටු දැකීම

2014 වර්ෂයේ අවසන් කාර්තුවේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අරමුදල් අනුග්‍රහය මත අනර්ථකාරී ළමා ශ්‍රමය පිටු දැකීම සම්බන්ධව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. කෑගල්ල හා අම්පාර දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් ලේකම්වරු, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් පාසල් දරුවන්ට දැනුම මිනුම, නාට්‍යය, චිත්‍ර හා පෝස්ටර් තරග පවත්වා ජයග්‍රාහකයන්ට තෑගි හා සහතිකපත් ප්‍රදානය කරන ලදී.

කෑගල්ල හා අම්පාර දිස්ත්‍රික්ක වල ළමා ශ්‍රමය හා අනර්ථකාරී ළමා ශ්‍රමය යෙදවුම පවතින පවුල් හඳුනා ගෙන එම පවුල්වල සාමාජිකයින්ගේ හා ඉහත සඳහන් දිස්ත්‍රික් 02 හි ළමා ශ්‍රමය ශූන්‍යය කිරිමෙහිලා කටයුතු කරන රාජ්‍ය නිළධාරීන්ගේ අත්සන් ලබා ගැනීමත්, ප්‍රතිඥා පොත් මුද්‍රණය කර ප්‍රතිඥාව කියවා අත්සන් ලබා ගැනීම පිණිස අදාළ ප්‍රදේශයන්ට බෙදා හැරීමත් සිදු කරන ලදී.

## කාන්තා දැනුවත් කිරීමේ වැඩසටහන්

2015 වසර තුළ වැවිලි අංශයේ සේවයේ නියුක්ත කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 8 ක් පැවැත්වීමට කටයුතු කරන ලද අතර උපදේශන වැඩසටහන් 15 ක් පවත්වන ලදී. එමෙන්ම කාන්තා දැනුවත් කිරීම් වෙනුවෙන් සේවාස්ථ වැඩසටහන් 19 ක් මේ වන විට පවත්වා ඇත.

## 2015 වසරේ මූල්‍ය ප්‍රගතිය

| | | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 982,340,000 | 967,407,000 | 1,100,630,000 | 1,138,550,000 | 1,411,200,00 |
| | වියදම (රු.) | 970,274,622 | 953,894,760 | 1,016,129,728 | 1,117,107,412 | 1,364,002,819 |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 371,936,197 | 372,365,000 | 760,275,000 | 373,200,00 | 1,705,904,00 |
| | වියදම (රු.) | 333,633,002 | 299,512,890 | 732,936,934 | 306,883,422 | 1,574,171,513 |

# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. වර්තමානයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

## දෙපාර්තමේන්තුවේ ගැසට් ගත ප්‍රධාන කාර්යයන්

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදු කෙරෙන වෙනත් සේවාවන් සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහසම්බන්ධිත සෙසු සියලු කටයුතු.

## මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 04 ක් යටතේ ක්‍රියාත්මක වේ.

- රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය
- මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය
- ආයතන අංශය
- ගිණුම් අංශය








## වෘත්තීය මාර්ගෝපදේශනය

වෘත්තීය මාර්ගෝපදේශනය පුද්ගලයින්ගේ වෘත්තීය ජීවිතය හා එහි සංවර්ධනය සාර්ථකව කළමනාකරණය කර ගැනීම සඳහා ඉවහල් වේ. රැකියාලාභීන් තුළ ආකල්ප වර්ධනය, උත්ප්‍රේරණය සහ අවශ්‍ය දැණුම දියුණු කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේදී වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පවත්වන ලදි. 2015 වසර අවසානය දක්වා වූ කාලය තුළ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහන් | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු.මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය | |
| අ.පො.ස. සාමාන්‍ය පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | - | - | 1,951 | 2,164 | 59,715 |
| අ.පො.ස. උසස් පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | - | - | 1,471 | 1543 | 43,961 |
| ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන් | 0.119 | 0.132 | 50 | 128 | 3,678 |
| වෘත්තීය අභියෝග ජයගැනීම | 0.391 | 0.387 | 50 | 72 | 2,538 |
| උපාධිධාරි වැඩසටහන (බාහිර) | 0.416 | 0.490 | 15 | 18 | 709 |
| උපාධිධාරි වැඩසටහන (අභ්‍යන්තර) | 0.416 | 0.249 | 15 | 9 | 425 |
| වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ගුරුවරුන් සඳහා | 1.75 | 1.660 | 50 | 76 | 2,622 |
| වෘත්තීය උපදේශනය/ පුහුණු සඳහා යොමු කිරීම -ප්‍රතිලාභීන් | | - | (40,584) | | (64,240) |
| දෙමව්පිය දැනුවත් කිරීමේ වැඩසටහන | 0.8 | 0.786 | 200 | 316 | 24,224 |
| වෘත්තීය මංපෙත් | 0.3 | 0.288 | 10 | 14 | 3,782 |
| අ.පො.ස. සා/පෙළින් පසු වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 0.45 | 0.316 | 09 | 18 | 2,652 |
| හසර සඟරාව | 0.5 | 0.454 | 04 | 02 | |
| අවධානමට ලක්වූවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | | | 1,180 | 2,084 | 40,375 |
| **එකතුව** | **5.142** | **4.762** | **5,005** | **6,444** | **184,681** |

## රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

2015 වසරේ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු .මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය | |
| අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් | 2.410 | 2.323 | 250 | 336 | 10735 |
| ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් | 0.646 | 0.647 | 25 | 40 | 1300 |
| උද්‍යාන කළමනාකරණ වැඩසටහන | 0.267 | 0.162 | 08 | 05 | 162 |
| ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා ගත කිරීම් වැඩසටහන් | | | 04 | 01 | 45 |
| නිදහස් රැකියා අවස්ථා ප්‍රවර්ධන වැඩසටහන් | 0.343 | 0.320 | 25 | 33 | 1114 |
| සංචාරක ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 0.403 | 0.442 | 15 | 19 | 741 |
| රැකියා සමාජ | 0.824 | 0.823 | 25 | 25 | 860 |
| අවධානමට ලක්වූවන් සඳහා පුහුණු වැඩසටහන | 0.482 | 0.416 | 40 | 49 | 1447 |
| රැකියා 100 වැඩසටහන | 0.8 | 0.766 | 08 | 09 | 2374 |
| සිවිල් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් ඇති කිරීම | 0.125 | 0.035 | 06 | 02 | 75 |
| ව්‍යවසායකයින්ගේ තාක්ෂණික හා මෘදු කුසලතා වර්ධනය කිරීම | 0.175 | 0.297 | 07 | 10 | 366 |
| **එකතුව** | **6.475** | **6.231** | **413** | **529** | **19219** |

## දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | සහභාගී වූ සංඛ්‍යාව | වියදම |
|---|---|---|
| කුරුණෑගල | 1800 | 2,48856.00 |
| මාතර | 2004 | 2,36172.00 |
| කෑගල්ල | 1717 | 1,76895.00 |
| බදුල්ල | 2525 | 2,40260.00 |
| නුවර | 2000 | 2,37800.00 |
| අනුරාධපුර | 350 | 1,09751.00 |





## මහජන රැකියා සේවා මධ්‍යස්ථාන කටයුතු

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මගින් දිවයින පුරා මහජන රැකියා සේවා (Public Employment Service) මධ්‍යස්ථාන 24 ක් මේ වන විට ක්‍රියාත්මක කරනු ලබයි. 2015 වසරේ මහජන රැකියා සේවා මධ්‍යස්ථාන කටයුතුවල ප්‍රගතිය පහත දක්වා ඇත

| දිස්ත්‍රික්කය | ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව | ලියාපදිංචි පුරප්පාඩු සංඛ්‍යාව | රැකියා ගැලපීම් සංඛ්‍යාව | රැකියාගත කිරීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කොළඹ | 1077 | 1620 | 2700 | 156 |
| ගම්පහ | 1242 | 1263 | 965 | 217 |
| හම්බන්තොට | 961 | 1139 | 802 | 180 |
| මාතර | 2104 | 1040 | 1755 | 430 |
| නුවර | 1429 | 330 | 453 | 189 |
| කෑගල්ල | 1605 | 835 | 1395 | 480 |
| කුරුණෑගල | 2372 | 535 | 2569 | 281 |
| රත්නපුර | 1263 | 614 | 721 | 144 |
| කළුතර | 1122 | 958 | 625 | 196 |
| ගාල්ල | 1495 | 277 | 843 | 169 |
| අනුරාධපුර | 495 | 483 | 667 | 147 |
| අම්පාර | 3259 | 1339 | 480 | 357 |
| මඩකලපුව | 1324 | 239 | 810 | 144 |
| බදුල්ල | 1258 | 1973 | 2499 | 128 |
| මොණරාගල | 372 | 1315 | 266 | 135 |
| යාපනය | 13002 | 2363 | 1290 | 425 |
| මාතලේ | 277 | 306 | 182 | 129 |
| පුත්තලම | 738 | 327 | 203 | 89 |
| නුවරඑළිය | 220 | 250 | 244 | 39 |
| පොලොන්නරුව | 586 | 168 | 123 | 35 |
| මන්නාරම | 1348 | 126 | 191 | 2 |
| කිලිනොච්චි | 2841 | 154 | 123 | 53 |
| ත්‍රිකුණාමලය | 1764 | 231 | 361 | 77 |
| වව්නියාව | 629 | 270 | 327 | 212 |
| **එකතුව** | **43,390** | **18,518** | **20,946** | **4437** |




## 2015 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය

| | ප්‍රතිපාදනය (රු.000') | වියදම (රු.000') | ඉතිරිය (රු.000') |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 312,300 | 310,136 | 2,163 |
| ප්‍රාග්ධන වියදම් | 40,500 | 36,434 | 4,065 |
| **එකතුව** | **352,800** | **346,571** | **6,228** |

# කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේදී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2005 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය, දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14 කින් සමන්විත වේ. කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාල කරගන්නා අතර, අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

## ප්‍රධාන අරමුණු

- රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරු වලින් තුවාල ලබන සේවකයින්ට වන්දි අයකර දීම.
- රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට වන්දි අයකර දීම.
- සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරු වලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම.

| කාර්යය | 2015.01.01 – 2015.12.31 දක්වා ප්‍රගතිය |
|---|---|
| 1. විධිමත් ලෙස වාර්තාගත කරන ලද අනතුරු සංඛ්‍යාව | 422 |
| 2. විභාගයට ගන්නා ලද ලිපිගොනු සංඛ්‍යාව | 2,268 |
| 3. කටයුතු අවසන් කරන ලද වන්දි අයදුම්පත් සංඛ්‍යාව | 247 |
| 4. ලියාපදිංචි කළ ගිවිසුම් සංඛ්‍යාව | 80 |
| 5. මාරක අනතුරු සම්බන්ධයෙන් වන්දි ලෙස අයකර ගත් මුදල් | 76,614,527.90 |
| 6. මාරක නොවන අනතුරු වෙනුවෙන් උසාවි නියෝගයන් අනුව සේවා යෝජකයන් විසින් සේවකයන්ට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය | 12,517,644.60 |
| 7. ලියාපදිංචි කළ ගිවිසුම්පත් අනුව මාරක නොවූ අනතුරු වෙනුවෙන් සේවකයින්ට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය | 8,899,323.70 |
| 8. මාරක අනතුරු සම්බන්ධයෙන් අයකර ගන්නා ලදුව බාල වයස්කාර යැපෙන්නන්ගේ ඉතිරිකිරීමේ ගිණුම්වල තැන්පත් කළ මුදල් ප්‍රමාණයන්. | 16,440,831.00 |
| 9. බාලවයස්කරුවන් වෙනුවෙන් විවෘත කළ ගිණුම් සංඛ්‍යාව | 109 |
| 10. බාල වයස්කරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු නිදහස් කළ ගිණුම් සංඛ්‍යාව | 194 |
| 11. එමගින් ගෙවූ මුදල් ප්‍රමාණය | 8,674,281.80 |

කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය ඉ-රාජ්‍ය සේවාව හා එක්වෙමින් සමස්ථ වැඩ කරන ජනතාවට වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා www.compensation.gov.lk නමින් නව වෙබ් අඩවියක් පවත්වාගෙන යනු ලැබේ.





# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2007 සැප්තැම්බර් 11 වන දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය නිල වශයෙන් ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මගින් බලාත්මක කරන ලදී. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය පාර්ශවය, වෘත්තීය සමිති නියෝජනය වන සේවක පිරිස් හා රජයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මගින් පාලනය වේ.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වර්තමානයේදී ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ එහි කටයුතු සිදු කරනු ලබන අතර කම්කරු දෙපාර්තමේන්තුව, අනෙකුත් රජයේ ආයතන, අර්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමගද සහයෝගීව කටයුතු කරනු ලබයි. තවද ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ජාත්‍යන්තර කම්කරු සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතන සමගද එක්ව කටයුතු කරනු ලබයි. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ඉන්දීය ජාතික කම්කරු ආයතනයක් වන වී.වී.ගිරි (V.V. Giri) ආයතනය සමග අන්‍යෝන්‍ය සහයෝගීතාවය සඳහා අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කර ඇත.

කම්කරු අණපනත්, නීතී රීතී රෙගුලාසි පිළිබඳව දැනුවත් ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය හා මෙහෙය වීම මෙම ආයතනය මගින් සිදුකරනු ලබයි.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය තුළ පහත දැක්වෙන ප්‍රධාන අංශ ක්‍රියාත්මක වේ.

i) පුහුණු හා සංවර්ධන අංශය
ii) පර්යේෂණ, සැලසුම් හා ප්‍රකාශන අංශය
iii) පාලන හා මුදල් අංශය

### 2015-01-01 සිට 2015-12-31 දක්වා සිදුකළ වැඩසටහන් වල ප්‍රගතිය

| වැඩසටහන් විස්තරය | සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව | අපේක්ෂා කළ ආදායම (රු.) | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
|---|---|---|---|---|
| ඩිප්ලෝමා | 3 | 2,772,000 | 2 | 2,991,500 |
| එක් දින වැඩසටහන් | 26 | 936,000 | 29 | 1,653,900 |
| දෙ දින වැඩසටහන් | 18 | 1,296,000 | 20 | 2,286,400 |
| තුන් දින වැඩසටහන් | 6 | 576,000 | 9 | 1,389,200 |
| විශේෂ වැඩසටහන් | | | 4 | 2,552,400 |
| විභාග පැවැත්වීම | - | - | 3 | 287,690 |

**2015 වර්ෂයේ විශේෂ ක්‍රියාකාරකම්**

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක වන රැකීරක්ෂා නීතිය, ශ්‍රම ප්‍රමිති හා වැඩ බිම තුළ අයිතිවාසිකම් සම්බන්ධ උසස් සහතික පත්‍ර පාඨමාලාව (Advance Certificate Course on Employment Law, Labour Standards and Rights at Work).
- තරුණ රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වීම.

**2015 වසරේ මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| 2015 වසරේ මුළු ආදායම (රු.000') | 22,716 |
| 2015 වසරේ මුළු වියදම (රු.000') | 21,482 |
| 2015/12/31 දිනට මුළු වත්කම් (රු.000') | 40,268 |
| 2015/12/31 දිනට මුළු වගකීම් (රු.000') | 218 |

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය

2005 අප්‍රේල් මස 28 වන දින කම්කරු හා වෘත්තීය සමිති සබදතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැලැක්වීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදෙමින් සේව්‍ය සේවක දෙපාර්ශවයටම වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීමට කටයුතු කර ඇත.

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල

2014 වසරේ දී ප්‍රථම වරට ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල පවත්වන ලදී. මෙම සම්මාන උළෙල සඳහා බහු ජාතික සමාගම් ඇතුළු ජාතික නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබා දෙන කර්මාන්ත, සංචාරක, ඉදිකිරීම්, කෘෂිකාර්මික, ආහාර ඇඟළුම් යන ක්ෂේත්‍ර නියෝජනය කරමින් සේවක සේව්‍ය දෙපිරිසම සහභාගි විය. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ගේ වෘත්තිය සුරක්ෂිතතාවය නගා සිටුවීම සඳහා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවන් ඇති කිරීම මෙම සම්මාන උළෙල පැවැත්වීමේ ප්‍රධාන අරමුණයි. බහු ජාතික සමාගම් අතරින් ී කැලණිතිස්ස සමාගම, ප්‍රීමියම් එක්ස්පෝර්ට් සමාගම සහ යුනිලීවර්-හොරණ යන ආයතන හා දේශීය අංශයෙන් මාස් ඇක්ටිව් සිනර්ජි, චායා ට්‍රාන්ස් හික්කඩුව සහ ෂජී කොන්ඩිමෙන්ට්ස් සමාගම යන ආයතනයන් වෘත්තීය සුරක්ෂිතතා සම්මාන ලබා ගන්නා ලදී.

### ඩිප්ලෝමා පාඨමාලාව / සහතික පත්‍ර පාඨමාලාව සහතිකපත් ප්‍රදානය

වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2014 වර්ෂයේදි සාර්ථකව නිම කරන ලද විධායක ශ්‍රේණියේ නිළධාරීන්ට සහතිකපත් ප්‍රදානය සිදුකළ අතර වැවිලි ක්ෂේත්‍රයේ සහතික පත් පාඨමාලාව නිම කළ සිසුන් සදහාද සහතිකපත් ප්‍රදානය කරන ලදී. 2015 වර්ෂයේදී වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කරන ලද විධායක ශ්‍රේණියේ නිළධාරින් 70ක් සදහා ඩිප්ලෝමාධාරීන් ලෙස සහතිකපත් ප්‍රදානය පවත්වන ලදී. කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් සදහා වූ සහතික පත් පාඨමාලාවට 2015 වර්ෂයේදී 4 වන කණ්ඩායම ලෙස 15 දෙනෙකු බඳවා ගන්නා ලදී.

### වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පිළිබද පුහුණු වැඩසටහන්

බොයිලේරු ක්‍රියාකරවන්නන් හා සම්බන්ධ පුහුණු වැඩසටහන 2015 අගෝස්තු 25, 26 හා 27 යන දිනයන්හි දි පැවැත්වූ අතර වැඩසටහන අවසානයේදි ක්ෂේත්‍ර චාරිකාවක් මගින් ඉලෙස්ටොමෙරික් ඉන්ජිනියරින් සමාගමේ තාක්ෂණික සහාය ඇතිව බොයිලේරු සම්බන්ධ ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දෙන ලදී.

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය සැමරීම වෙනුවෙන් 2015 ඔක්තෝම්බර් මස දෙවන සතියේදී පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

| දිනය | වැඩසටහන | පවත්වන ලද ස්ථානය |
|---|---|---|
| 2015/10/12 | මාධ්‍ය හමුව හා වෘත්තියේ යෙදී සිටියදී පාද අහිමි වුවන් සඳහා කෘතිම පාද ප්‍රදානෝත්සවය | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන ශ්‍රවණාගාරය |
| 2015/10/13 | වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්(කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා) | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන ශ්‍රවණාගාරය |
| 2015/10/14 | සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය හා ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානෝත්සවය | කොළඹ ගලධාරි හෝටලය |
| 2014/10/20 | වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන(මොරටුව විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා) | මොරටුව විශ්ව විද්‍යාලය |

### 2015 වසරේ මුල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| 2015 වසරේ මුළු ආදායම (රු.000') | 29,524 |
| 2015 වසරේ මුළු වියදම (රු.000') | 22,437 |
| 2015/12/31 දිනට මුළු වත්කම් (රු.000') | 78,739 |
| 2015/12/31 දිනට මුළු වගකීම් (රු.000') | 1,819 |





# ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා වෘත්තීය සමිති අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභසාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල පනතේ අරමුණු 6 ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභසාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය ජාතික සම්පත ලොතරැයි අලෙවියත් සමග ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩිවීමත් සමග කම්කරු සුභසාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද මේ සමග වර්ධනය කර ගත හැක.

## ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

- සේවා නියුක්තයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.
- සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, එම සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.
- හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.
- සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.
- ව්‍යසන අවස්ථාවල දී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.
- සේවා නියුක්තයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

## 2015-01-01 සිට 2015-12-31 දින දක්වා කාර්ය සාධනය

| වැඩසටහන / ක්‍රියාකාරකම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහන් | 2 | 100 |
| වෛද්‍ය හා අක්ෂි සායන පැවැත්වීම | 8 | 3360 |
| සවිබල ගැන්වීමේ වැඩසටහන් | 1 | 200 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 16 | 900 |

## 2015 වසරේ මුල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| 2015 වසරේ මුළු ආදායම (රු.000') | 65,398 |
| 2015 වසරේ මුළු වියදම (රු.000') | 26,905 |
| 2015/12/31 දිනට මුළු වත්කම් (රු.000') | 373,491 |
| 2015/12/31 දිනට මුළු වගකීම් (රු.000') | 3,551 |

# කම්කරු දෙපාර්තමේන්තුව - සංඛ්‍යාලේඛණ

## කාර්මික සම්බන්ධතා අංශය

| | | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|
| **කාර්මික ආරවුල් පිළිබඳ සංඛ්‍යාලේඛණ** | | | | | | |
| වාර්තා වූ සංඛ්‍යාව | | 3,756 | 3,702 | 3,204 | 2,948 | 1,561 |
| විසඳූ සංඛ්‍යාව | | 3,384 | 3,695 | 3,077 | 2,903 | 1,493 |
| ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව | | 66 | 43 | 34 | 50 | 40 |
| **වෘත්තීය සමිති කටයුතු** | | | | | | |
| ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති/සම්මේලන | | 76 | 114 | 108 | 125 | 196 |
| අවලංගු කරන ලද වෘත්තීය සමිති/සම්මේලන | | 38 | 02 | 114 | 255 | 315 |
| ක්‍රියාත්මක සමස්ත වෘත්තීය සමිති ගණන | | | | | | 1,888 |
| ක්‍රියාත්මක සමස්ත වෘත්තීය සම්මේලන | | | | | | 30 |
| **කාර්මික අධිකරණ කටයුතු** | | | | | | |
| අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම | | 69 | 43 | 49 | 53 | 28 |
| ප්‍රධාන නිකුත් කිරීම | | 35 | 26 | 35 | 42 | 35 |
| **වැඩ වර්ජන වාර්තාවීම පිළිබඳ සංඛ්‍යාලේඛණ** | | | | | | |
| වැඩ වර්ජන වාර්තා වීම | වතු | 14 | 14 | 22 | 31 | 20 |
| | ආයතන | 07 | 20 | 20 | 07 | 16 |
| සහභාගි වූ සේවක සංඛ්‍යාව | වතු | 2,713 | 4,338 | 5,031 | 4,833 | 5,229 |
| | ආයතන | 3,742 | 5,626 | 6,088 | 1,618 | 3,171 |
| අහිමි වූ මිනිස් දින ගණන | වතු | 9,877 | 25,043 | 41,669 | 29,165 | 29,743 |
| | ආයතන | 15,543 | 10,774 | 38,754 | 8,158 | 8,630 |
| **සේවය අවසන් කිරීමේ අංශයේ කටයුතු** | | | | | | |
| පැමිණිලි යොමු වූ සංඛ්‍යාව | | 86 | 92 | 134 | 149 | 171 |
| පැමිණිලි විසඳූ සංඛ්‍යාව | | 111 | 143 | 112 | 148 | 162 |
| සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම් පත් සම්බන්ධයෙන් අවසර දීම | | 29 | 31 | 41 | 51 | 24 |
| **සමාජ කතිකාවත පිළිබඳ වැඩසටහන් පැවැත්වීම** | | | | | | |
| සමාජ කතිකා අංශය මගින් | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | 98 | 153 | 187 | 85 | 80 |
| | සහභාගී වූ සේවක සංඛ්‍යාව | 4,800 | 4,751 | 6,560 | 4,186 | 4,403 |
| දිස්ත්‍රික් හා උප කාර්යාල මගින් | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | 124 | 225 | 214 | 101 | 116 |
| | සහභාගී වූ සේවක සංඛ්‍යාව | 4,478 | 7,902 | 7,768 | 3,714 | 4,094 |





## නීති ක්‍රියා අංශය

| පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2014** | **2015** |
| 01. පාරිතෝෂික ගෙවීම් පනත | 4,092 | 3,404 | 2,371 | 545 | 2,524 |
| 02. කාර්මික ආරවුල් පනත | 72 | 77 | 126 | 45 | 153 |
| 03. සේවය අවසන් කිරීමේ පනත | 65 | 59 | 58 | 12 | 49 |
| 04. පඩි පාලක සභා ආඥා පනත | 238 | 290 | 203 | 66 | 282 |
| 05. සාප්පු හා කාර්යාල සේවක පනත | 80 | 132 | 112 | 25 | 99 |
| 06. ප්‍රසූතිකාධාර ආඥාපනත | 01 | 02 | 05 | - | 03 |
| 07. ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 05 | 10 | 07 | 02 | 05 |
| 08. සේවක අර්ථසාධක අරමුදල් පනත | 3,483 | 3,210 | 3,415 | 829 | 2,336 |
| 09. කම්කරු විනිශ්චය සභා නියෝග | 153 | 165 | 144 | 45 | 164 |
| 10. අයවැය සහන දීමනා පනත | 54 | 134 | 22 | 13 | 29 |
| 11. අනුමත අර්ථසාධක අරමුදල් | - | 07 | 01 | - | 03 |

## විශේෂ විමර්ශන අංශය

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| පැමිණිලි පරීක්ෂණ | 241 | 264 | 122 | 84 | 292 |
| ගණනය කරන ලද සේ.අ.අ. හිඟ වටිනාකම (රු. දහස්) | 153,483 | 313,770 | 28,012 | 11,338 | 634,969 |
| ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත මුදල් වටිනාකම (රු. දහස්) | 12,295 | 40,831 | 5,814 | 898 | 4,996 |

## කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව (වර්ෂය අවසාන දිනට) | 20,971 | 22,459 | 23,974 | 25,236 | 26,198 |
| සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 4,749 | 6,700 | 6,372 | 5,063 | 5,090 |
| පරීක්ෂකයින් (ඉංජිනේරුවරුන්) සංඛ්‍යාව | 27 | 28 | 28 | 30 | 28 |
| පිඹුරුපත් අනුමැතිය | 122 | 106 | 97 | 111 | 130 |
| දේශන හා සම්මන්ත්‍රණ | 294 | 229 | 218 | 147 | 205 |

## වෘත්තීය ස්වස්ථතා අංශය

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| කර්මාන්තශාලා පරීක්ෂණ සංඛ්‍යාව | 220 | 410 | 352 | 250 | 312 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 193 | 137 | 190 | 296 | 204 |

## සේවක අර්ථසාධක අරමුදල් අංශය

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | 14,162,590 | 14,559,328 | 15,203,073 | 15,831,410 | 15,831,410 # |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | 192,044 | 198,893 | 204,777 | 210,595 | 210,595# |
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1,020,072 | 1,144,409 | 1,299,974 | 1,486,931 | 1,664,852 |
| සක්‍රීය සාමාජික සංඛ්‍යාව (මිලියන)* | 2.21 | 2.34 | 2.40 | 2.40 | 2.40 |
| සක්‍රීය සේවායෝජක සංඛ්‍යාව** | 64,562 | 68,140 | 69,148 | 69,683 | 72,914 |

| | | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|
| නව ලියාපදිංචි කිරීම් | සේවාදායකයින් | 750,941 | 127,138 | 813,010 | 827,883 | 827,883 # |
| | සේවා යෝජකයින් | 6,403 | 10,060 | 7,802 | 6,176 | 5770 ## |
| ප්‍රතිලාභ ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 120,109 | 115,654 | 114,275 | 127,492 | 127,107 |
| | ගෙවූ ප්‍රතිලාභ මුදල (රු. මිලියන) | 47,311 | 48,015 | 50,062 | 65,118 | 77,769 |
| දායක මුදල් රැස්කිරීම (රු. මිලියන) | | 61,879 | 70,157 | 77,335 | 90,049 | 102,453 |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 19,709 | 11,182 | 16,268 | 17,786 | 13,132 |
| | අනුමත කළ ණය මුදල් වටිනාකම (රු. මිලියන) | 6,253 | 3,951 | 6,914 | 8,021 | 5,377 |

* වර්ෂය තුළ එක්වරක් හෝ දායක මුදල් ගෙවන ලද සාමාජික ගිණුම්
** වර්ෂය තුළ එක්වරක් හෝ සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවන ලද සේව්‍යයන්
\# දැනට තොරතුරු ලැබී නොමැත. 2014/12/31 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු වේ.
\#\# 2015/09/30 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු වේ.





## අදාළ කාල සීමාව තුළ අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම්වලින් බිඳක්...



ජාතික කම්කරු උපදේශක සභා රැස්වීම. 2015-10-01



අවිස්සාවේල්ල සීතාවක පැවති වෘත්තීය සුරක්ෂිතතා පාගමන. 2015-10-13



ජාත්‍යන්තර ළමා දිනය නිමිත්තෙන් පැවති පාගමන. 2015-10-01



80 ජූලි වර්ජකයන් සඳහා වන්දි ප්‍රදානය. 2015-03-18



ශ්‍රම වාසනා අරමුදල මගින් නිකවැරටියෙදී පවත්වන ලද අක්ෂි සායනය. 2015-06-22




ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වන ලද වැඩබිමේ වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය. 2015-10-14



ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික ඩිප්ලෝමා ත්‍යාග ප්‍රදානෝත්සවය. 2015-01-08



ශ්‍රම වාසනා අරමුදල මගින් පවත්වන ලද අක්ෂි කඳවුර. ශ්‍රී ක්‍රිෂ්ණා විදුහල -කහවත්ත. 2015-10-25



ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහ ඇ.එ.ජ. කම්කරු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ක්‍රියාත්මක කරන "Fundamental Principles of Rights at work" ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය. 2015-09-25



මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් හා රැකියා පොළ -කෑගල්ල දිස්ත්‍රික්කය -2015-03-21



අම්පාර කම්කරු කාර්යාලයේදී ඇඟිලි සලකුණු ලබා ගැනීම 2015-11-07



අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද බාහිර ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන. (කලාවැව විජිතපුර ජාතික ධීවර හා ජලජ ජීවී වගා සංවර්ධන ආයතනය) 2015-10-11 සහ 12.

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**
**தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சு**
**MINISTRY OF LABOUR AND TRADE UNION RELATIONS**

ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වූවන්ගේ ජීවන හා සේවා තත්ත්වයන් වර්ධනය කිරීම මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය-සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූලික පරමාර්ථ වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින්වර ඇති කරන ලද කම්කරු නීති හා අණපනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්ය භාරයද පුළුල්ය.

இலங்கையில் நியதிச் சபைகள் மற்றும் தனியார்துறை நிறுவனங்களில் பணியாற்றுகின்ற அண்ணளவாக 8.5 மில்லியன் தொழிலாளர்களின் வாழ்க்கை மற்றும் தொழில் தரங்களை அதிகரித்தல் உட்பட தேசியஉற்பத்தி மற்றும் தொழில் உற்பத்தித்திறன் அதிகரிப்பிற்குத் தேவையான தொழில் அமைதி, தொழில்வழங்குநர் - தொழிலாளரிடையேயான உறவுகளை உருவாக்கி குறித்த கொள்கைகளைத் தயாரித்தல், அவற்றை அமுலாக்குதல் போன்றவை தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சின் பிரதான குறிக்கோள்களாகும். தொழிலாளர்களின் நலன்களை முன்னிட்டு அடிக்கடி உருவாக்கிக்கொண்ட தொழிற்சட்டங்கள், ஒழுங்குவிதிகளுக்கேற்ப இந்த அமைச்சிற்குப் பொறுப்பாக்கப்பட்டுள்ள கடமைகளும் விரிவானதாகும்.

Main objectives of the Ministry of Labour and Trade Union Relations are formulation of policies and implement those policies that establish the industrial peace and employer and employee relationship, which are pre-requisites for the increase of the production and the labour productivity, with the view of improving the quality of life and service conditions of the working population of about 8.5 million, who are employed in the private and semi-government sector of Sri Lanka. The functional area entrusted to this ministry gets broadened along with labour laws and legislations that are formed from time to time, for the welfare of the working people.

**තැ. පෙ. 1519, දෙවන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.**
த. பெ. 1519, 2 ஆவது தளம், தொழில் செயலகம், நாரஹேன்பிட்டி, கொழும்பு 05.
**P. O. Box 1519, 2nd Floor, Labour Secretariat, Narahenpita, Colombo 05.**